# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (ගෞරව) උපාධි දෙවන වසර පරීක්ෂණය - 2019/2020

## නර්තන හා නාට්‍ය කලා පීඨය

## වාද්‍ය කලා සිද්ධාන්ත – DPMD 21042

කාලය :- පැ 03

❖ සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

---

❖ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් (02) සහ ප්‍රශ්න අටකින් (08) සමන්විත ය.
❖ එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් (01) හෝ තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
❖ එක් එක් කොටස සඳහා පිළිතුරු සැපයීමේදී පිළිතුරු ලියන පොත් වෙන වෙනම භාවිත කළ යුතුය.
❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
❖ සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ලැබේ.

---

## I කොටස

01. විශ්ව බෙරවර්ගීකරණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කර ශ්‍රී ලාංකේය එක් බෙරයක්, එම වර්ගීකරණයට අයත්වන ආකාරය පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලාංකේය බෙරවාදන කලාවේ පැවැත්මට ජන සාහිත්‍යය බලපා ඇති අයුරු සාකච්ඡා කරන්න.

03. “ශ්‍රී ලාංකේය බෙර වාදනයේ ප්‍රායෝගික කොටස් ගොඩනැගී ඇත්තේ බෞද්ධ සංකල්ප මතය.” ඔබේ අදහස් දක්වන්න.

04. දේශීය ශාන්තිකර්ම පුද පූජා සහ චාරිත්‍ර වාදන කලාව මූලික කොටගෙන ගොඩනැගී ඇත.” එක් ශාන්තිකර්මයක් ඇසුරෙන් විමසන්න.

05. දේශීය ශාන්තිකර්ම පූජා චාරිත්‍රයන්හි නාට්‍යමය ලක්ෂණ උද්දීපනය කිරීමෙහිලා බෙරවාදනයෙන් ලැබෙන පිටිවහල පිළිබඳ කරුණු දක්වන්න.

## II කොටස

06. i. ඡන්දස සහ ගණ පිළිබඳ හැඳින්වීමක් කරන්න.
ii. පහත දැක්වෙන ශ්ලෝකය සටහන් කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී මත් පංකජ විශ්ටරෝ හරිහරෝ වායෝර් මහේන්ද්‍රෝ නලඃ
චන්ද්‍රෝ භාෂ්කර විශ්මපාල වරුනඃ ප්‍රේතාධිපා දීඃග්‍රහඃ
රජ්ජුන්නෝ නල කුබරඃ සුරගජඃ චින්තාමනී කව්ස්තු තං
ස්වාමීන් ශක්තිදරඃ ස්වලං බලධරඃ කුර්වන්තුතේ මංගලම්

අ. ඉහත සඳහන් ශ්ලෝකයෙහි ලඝු හා ගුරු මාත්‍රා ලකුණු කරන්න.
ආ. එක් එක් පාදයෙහි ලඝු හා ගුරු මාත්‍රා සංඛ්‍යාව වෙන වෙනම ලියා දක්වන්න.
ඉ. එක් එක් පාදයෙහි ඇතුලත් ගණ සංඛ්‍යාව ලියා දක්වන්න.

07. i. කර්ණාටක තාල පද්ධතියේ ප්‍රධාන අංග පිළිබඳ විස්තර කරන්න.
ii. සප්ත තාල නම් කොට ඉන් එක් තාලයක් තෝරාගෙන ජාති භේදයට අනුකූලව තාල ගොඩනැගෙන ආකාරය පහදන්න.

08. තබ්ලා, පඛාවාජ්, මෘදංගම් සහ කංජිරා යන අවනද්ධ භාණ්ඩ අතුරින් දෙකක ව්‍යුහය රූපසටහන් ඇසුරින් විස්තර කොට ඒවායේ උපයෝගීතාව ලියා දක්වන්න.

……………………

2023.02.01